**ඉතා වැදගත් / ඉතා හදිසියි.**

මගේ අංකය :- SG/Admin/CS /8/මැතිවරණ,
ආයතන අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2020.07.22 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැ.සි.ආ.) / සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී, කාර්මික හා පරිපාලන නිලධාරීන්,
පරිපාලන නිලධාරි (වැ.බ.),

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**විශ්‍රාම යෑම හෝ කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ නිරෝධායනයට ලක් වීම හේතුවෙන් තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ ඡන්ද හිමියන්ගේ තොරතුරු**

උක්ත කරුණ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභා සභාපතිගේ අංක : EC/PE/2020/09 හා 2020.07.17 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02. ඒ අනුව එම ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින අදාළ නිලධාරීන් මෙම කරුණු පිළිබඳව දැනුවත් කර ඒ අනුව කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.පී. හේරත්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් කාර්යාලය
තැ.පෙ. 506, කිරුළ පාර,
කොළඹ 05.

එච්.එම්.ටී.පී.හේරත්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

# මැතිවරණ කොමිෂන් සභාව

## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

155787

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/PE/2020/09<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2020.07.17<br>திகதி |

21 JUL 2020

**ඉතා වැදගත්**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු /
පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් /
කොමිෂන් සභා ලේකම්වරු/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,
යුධ හමුදාපති/ගුවන් හමුදාපති/ නාවික හමුදාපති/ පොලිස්පති
අණදෙන නිලධාරී (පොලිස් විශේෂ කාර්ය බලකාය)

3.00 P.M.

***පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05***
***විශ්‍රාම යෑම හෝ කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ නිරෝධායනයට ලක් වීම හේතුවෙන් තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ ඡන්දහිමියන්ගේ තොරතුරු***

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද සලකුණු කිරීම 2020.07.21 දිනෙන් අවසන් වීමට නියමිතය.

02. තැපැල් ඡන්ද අයදුම් කළ රාජ්‍ය සේවයේ හා ආරක්ෂක අංශ සාමාජිකයින් යම් ප්‍රමාණයක් Covid 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන මේ වන විටත් ස්වයං නිරෝධායනය වන බව දන්වා ඇති හෙයින් එම තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට නිරෝධායන කටයුතු අවසන් වූ පසුව තැපැල් ඡන්දය සලකුණු කිරීමට හෝ තැපැල් ඡන්දය අවලංගු කොට ඔවුන්ගේ ඡන්දය ලියාපදිංචි ස්ථානයට අදාළ ඡන්ද පොළෙහි දී ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි පහසුකම් සලසා දීමට ඇති හැකියාව පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරමින් සිටී.

03. එයට අමතරව 2020 පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් 2020 මාර්තු මාසයේ දී කැඳවන ලද බැවින් හා 2020 අප්‍රේල් 25 පැවැත්වීමට තිබූ මැතිවරණය Covid 19 තත්ත්වය යටතේ 2020 අගෝස්තු 05 දක්වා කල් දැමීමට සිදු විය. මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි වූ නමුත් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ අවසන් දිනය වන 2020 ජූලි 21 වන දිනට පෙර විශ්‍රාම යාම හේතුවෙන් තැපැල් ඡන්දය භාවිතා කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම පහසුකම සලසා දීමට අපේක්ෂා කෙරේ.

04. එබැවින් ඔබ ආයතනයේ සේවය කරනු ලබන Covid 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ස්වයං නිරෝධායනය වන තැපැල් ඡන්ද අයදුම් කළ හා 2020.07.21 දිනට පෙර විශ්‍රාම ගැනීම හේතුවෙන් ස්වකීය තැපැල් ඡන්දය සලකුණු කිරීමට නොහැකි වූ නිලධාරීන්ගේ තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවට පිටපතක් ද සහිතව අමුණා ඇති ආකෘතියට අනුව 2020.07.22 දිනට පෙර අදාළ නිලධාරීන්ගේ කාර්යාල පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට යවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)

පිටපත්
01. සියලුම තේරීම්භාර නිලධාරීවරුන් ] සියලු සහතික කිරීමේ

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

### විශ්‍රාම යෑම හෝ කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ නිරෝධායනයට ලක් වීම හේතුවෙන් තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ ඡන්දහිමියන්ගේ තොරතුරු

| අනු අංකය | තැපැල් ඡන්ද හිමියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | තැපැල් ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි දිස්ත්‍රික්කය | සහතික කිරීමේ නිලධාරී වෙත ලැබී ඇති තැපැල් ඡන්ද පැකට්ටුවේ QR කේත අංකය | ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ හේතුව (නිරෝධායනය/ විශ්‍රාම යෑම ද යන වග) නිරෝධායනය වන්නේ නම් එම ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

සහතික කිරීමේ නිලධාරියාගේ නම :

කාර්යාලයීය ලිපිනය :

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :

නම :

නිල මුද්‍රාව :

දිනය :

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல : 011-2868426

web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)


| මගේ අංකය :<br>எனது இல: EC/PE/2020/09 | ඔබේ අංකය :<br>உமது இல: | දිනය :<br>திகதி: 2020.07.17 |
|---|---|---|

**மிக முக்கியமானது**

அனைத்து அமைச்சுக்களின் செயலாளர்கள்/ மாகாண சபைகளின் பிரதம செயலாளர்கள்/
மாகாண சபை அமைச்சுக்களின் செயலாளர்கள்/ ஆளுநர்களின் செயலாளர்கள்/
திணைக்களத் தலைவர்கள்/ ஆணைக்குழுக்களின் செயலாளர்கள்/
அரச கூட்டுத்தாபனங்கள் மற்றும் நியதிச்சட்ட சபைகளின் தலைவர்கள்,
தரைப்படைத் தளபதி/ வான்படைத் தளபதி/ கடற்படைத் தளபதி/ பொலிஸ்மா அதிபர்,
கட்டளையிடும் அதிகாரி (பொலிஸ் விசேட அதிரடிப்படை),

<u>பாராளுமன்றத் தேர்தல் - 2020.08.05</u>

<u>சேவையிலிருந்து ஓய்வுபெறுதல் காரணமாக அல்லது கொவிட்-19 தொற்றுநோய் நிலைமையின் கீழ் தனிமைப்படுத்தலுக்கு உட்படுத்தப்படுவதன் காரணமாக அஞ்சல் வாக்கு அடையாளமிட வாய்ப்புக் கிடைக்காத வாக்காளர்களின் தகவல்கள்</u>

2020.08.05 ஆந் திகதி நடைபெறவுள்ள பாராளுமன்றத் தேர்தலின்போது அஞ்சல் வாக்கு அடையாளமிடுதல், 2020.07.21 ஆந் திகதியுடன் முடிவடையவுள்ளது.

02. அஞ்சல் மூலம் வாக்களிப்பதற்கு விண்ணப்பித்துள்ள அரச சேவையின் பாதுகாப்புப் பிரிவுகளினதும் ஓரளவான அங்கத்தவர்கள் Covid-19 தொற்றுநோய் நிலைமை காரணமாக தற்போது சுய தனிமைப்படுத்தலுக்கு உட்படுத்தப்பட்டிருப்பதாக அறிவிக்கப்பட்டுள்ளமையால், குறித்த அஞ்சல் வாக்கு விண்ணப்பகாரர்களுக்கு தனிமைப்படுத்தல் நடவடிக்கைகள் முடிவடைந்த பின் அஞ்சல் வாக்கு அடையாளமிடுவதற்கு அல்லது அஞ்சல் வாக்கை இரத்துச்செய்து அவர்களின் வாக்கு பதிவு செய்யப்பட்டுள்ள இடத்திற்குரிய வாக்கெடுப்பு நிலையத்தில் வாக்களிக்கக்கூடிய விதத்தில் வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கான ஆற்றல் சம்பந்தமாக தேர்தல் ஆணைக்குழு செயலாற்றி வருகிறது.

03. இதற்கு மேலதிகமாக, 2020 பாராளுமன்றத் தேர்தலுக்காக 2020 மார்ச் மாதத்தில் அஞ்சல் வாக்கு விண்ணப்பம் கோரப்பட்டமையால், 2020 ஏப்ரல் மாதம் 25 ஆந் திகதி நடைபெறவிருந்த தேர்தலை Covid-19 நிலைமையின் கீழ் 2020 ஆகஸ்ட் மாதம் 05 ஆந் திகதி வரை ஒத்திவைக்க நேரிட்டது. இந்தத் தேர்தலின்போது அஞ்சல் வாக்காளரொருவராகப் பதிவுசெய்யப்பட்டுள்ளபோதும் அஞ்சல் வாக்கு அடையாளமிடுவதற்கான இறுதித் தினமாகிய 2020 யூலை மாதம் 21 ஆந் திகதிக்கு முன்னர் சேவையிலிருந்து ஓய்வுபெறுவதன் காரணமாக அஞ்சல் வாக்களிக்க முடியாதநிலை ஏற்பட்ட அலுவலர்களுக்கும் இவ்வசதிகளை ஏற்படுத்திக் கொடுக்க எதிர்பார்க்கப்படுகிறது.

04. ஆகையால், தங்கள் நிறுவனத்தில் பணிபுரியும் Covid-19 தொற்றுநோய் நிலைமை காரணமாக சுய தனிமைப்படுத்தலுக்கு உள்ளாகிவரும் அஞ்சல் மூலம் வாக்களிப்பதற்கு விண்ணப்பித்த மற்றும் 2020.07.21 ஆந் திகதிக்கு முன்னர் சேவையிலிருந்து ஓய்வுபெறுவதன் காரணமாக தனது அஞ்சல் வாக்கை அடையாளமிட முடியாதநிலை ஏற்பட்ட அலுவலர்களின் தகவல்களை தேர்தல் ஆணைக்குழுவுக்கு பிரதியொன்றுடன் இணைக்கப்பட்டுள்ள படிவத்திற்கமைய 2020.07.22 ஆந் திகதிக்கு முன்னர் சம்பந்தப்பட்ட அலுவலர்களின் அலுவலகங்கள் அமைந்துள்ள மாவட்டத்தின் மாவட்ட தேர்தல்கள் அலுவலகங்களுக்கு அனுப்பிவைக்குமாறு தயவுடன் வேண்டுகின்றேன்.

மஹிந்த தேசப்பிரிய
தவிசாளர், தேர்தல் ஆணைக்குழு
(தேர்தல் ஆணைக்குழு சார்பாக)

## பாராளுமன்றத் தேர்தல் - 2020.08.05

**சேவையிலிருந்து ஓய்வுபெறுதல் காரணமாக அல்லது கோவிட்-19 தொற்றுநோய் நிலைமையின் கீழ் தனிமைப்படுத்தலுக்கு உட்படுத்தப்படுவதன் காரணமாக அஞ்சல் வாக்கு அடையாளமிட வாய்ப்புக் கிடைக்காத வாக்காளர்களின் தகவல்கள்**

| தொ. இல. | அஞ்சல் வாக்காளரின் பெயர் | தேசிய அடையாள அட்டை இல. | அஞ்சல் வாக்காளரொருவராகப் பதிவுசெய்துள்ள மாவட்டம் | அத்தாட்சிப்படுத்தும் அலுவலருக்குக் கிடைத்துள்ள அஞ்சல் வாக்குச்சீட்டுப் பக்கெற்றின் QR குறியீட்டு இலக்கம் | வாக்களிக்க முடியாதநிலை ஏற்பட்டதற்குரிய காரணம் (தனிமைப்படுத்தப்படுதலா/ ஓய்வுபெறுதலா) தனிமைப்படுத்தப்படுதலாயின், அவ்விடத்தின் முகவரி |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

அத்தாட்சிப்படுத்தும் அலுவலரின் பெயர்:

அலுவலக முகவரி:

மேற்படி தகவல்கள் சரியானவை என்பதை உறுதிப்படுத்துகின்றேன்.

திணைக்களத் தலைவரின் கையொப்பம்:

பெயர்:

பதவி முத்திரை:

திகதி: